ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව

ලංසු සඳහා ආරාධනය

"සුහුරුපාය" ගොඩනැගිල්ලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 1 වන හා 2 වන මහල්වල C සහ D අංශ (පොදු ප්‍රදේශ) සඳහා බිම් ඇතුරුම් සැපයීම, භාර දීම හා ඇතිරීම සඳහා ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත්තු (IFB) අංකය: DIE/PRO/02/2026/33

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින්, ***"සුහුරුපාය" ගොඩනැගිල්ලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 1 වන හා 2 වන මහල්වල C සහ D අංශ (පොදු ප්‍රදේශ) සඳහා බිම් ඇතුරුම් සැපයීම, භාර දීම හා ඇතිරීම*** සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය (NCB) යටතේ සිදු කෙරේ.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2026.09.25 දින සිට 2026.10.09 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ** රුපියල් පන්දහසක (රු. 5000.00) ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව, බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය", 05 වන මහලේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකි වේ. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළ අංක 0112 - 101559 දරන දුරකථනය ඔස්සේ ඇමතුම් ලබා ගැනීම තුළින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය. **2026.09.25 දින සිට 2026.10.09 දින දක්වා** කාල පරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය **(www.immigration.gov.lk)** වෙත පිවිසීම මගින් ද ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත" (Original) සහ "අනුපිටපත" (Duplicate) ලෙස වෙන වෙනම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තැබිය යුතු අතර මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවට අදාළ නම සහ IFB අංකය පැහැදිලිව දැක්විය යුතුය. මුද්‍රා තැබූ ලංසු **2026.10.09 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර** ලැබෙන පරිදි, ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට යැවීම හෝ 3 ඡේදයේ දක්වා ඇති ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. ලංසුව ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දින සිට **දින අනූ එකක් (91) දක්වා** හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන, දීර්ඝ කරන ලද යම් දිනයක් දක්වා **වලංගුභාවයෙන් යුක්ත විය යුතුය.** ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

6. සියලුම ලංසු සඳහා ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ තුනක (රු. 300,000.00) ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය ලංසු කැඳවීම අවසන් වන දින සිට දින එකසිය දහනවයක කාලයක් සඳහා වලංගුව පැවතිය යුතු වේ (2027.02.05 දින දක්වා වලංගු වේ).

7. **2026.10.02 දින පස්වරු 2.00** ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය", 05 වන මහලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ දී **පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වේ.** උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට එම අවස්ථාවේ දී අදාළ පරිශ්‍රය පරීක්ෂා කළ හැකි වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
05 වන මහල, "සුහුරුපාය",
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.